# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ)

**ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

බදුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා විසින්
2013 ජනවාරි මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 දෙසැම්බර් මස 03 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[199 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 003558—750(2009/01)

## ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ)

**ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එහි අධ්‍යක්ෂවරුන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම සංස්ථාපිත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2013 අංක    දරන ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් සංස්ථාගත කිරීම.*

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "ෆවුන්ඩේෂන් (පදනම)" යනුවෙන් සඳහන් කරනු ලබන) ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන්හි දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සාමාජිකයන් ද, ග්ලෝබල් හියුමනිටේරියන් ෆවුන්ඩේෂන් යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

3. සංස්ථාව පිහිටුවනු ලබන පොදු පරමාර්ථ පහත පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ප්‍රජාවගේ සුබසාධනය, සමාජීය සංවර්ධනය, මානුෂික ප්‍රජා සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, අධ්‍යාපනික, ආගමික, සංස්කෘතික හා සිවිල් උන්නතිය සඳහා ක්‍රියාශීලී සුහදත්වය ගොඩනැංවීමට ප්‍රජාවට අවස්ථාවක් ලබාදීම;

PL 006892 -750 (2013/01)

(ආ) සංස්ථාවෙහි සෑම නියෝජිතයකුගේම වෘත්තීය හා ව්‍යාපාරික තත්ත්වයන්ට අදාළ ආචාර ධර්ම පද්ධතිය උසස් මට්ටමකින් පවත්වාගෙන යෑමට උපකාරී වන අතරම එය ඇගයීමට ලක් කිරීම මගින් වෘත්තීයමය සංවර්ධනයක් ඇති කිරීම මගින් අභිමානයක් ගොඩනගා එමගින් සමාජමය සුබසාධනය පිළිබඳ අපේක්ෂා ඇති කිරීම;

(ඇ) ෆවුන්ඩේෂන්හි සෑම සාමාජිකයකුගේම පෞද්ගලික, ව්‍යාපාරික සහ සමාජීය ජීවිතය සංස්ථාවෙහි පරමාදර්ශීය පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා යෙදවීම;

(ඈ) සේවා පරමාර්ථ ඉටු කරගැනීම සඳහා ව්‍යාපාරික සහ වෘත්තීය ප්‍රජාව ඒකරාශී කොට ජාත්‍යන්තර සබඳතා මගින්, ජාත්‍යන්තර හොඳහිත, අවබෝධය සහ සාමය වඩාත් පරමාදර්ශී මට්ටමකට ගෙන ඒමට උපරිම දායකත්වය ලබාදීම;

(ඉ) ප්‍රජා සේවා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් ආගමික සහජීවනය වර්ධනය කිරීමට දිරිමත් කිරීම;

(ඊ) මහජනතාවට වඩාත් වැදගත් වන කරුණු පිළිබඳ විවෘත සංවාද පැවැත්වීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ සියල්ල හෝ ඉන් කිසිවක් හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය අනෙකුත් ක්‍රියා සහ දේවල් කිරීම;

(ඌ) යම් කර්මාන්තයක හෝ වෙළෙඳාමක නැතහොත් යම් අපනයන හෝ ආනයන ව්‍යාපාරයක නිරත වීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ ව්‍යාපාරික කර්මාන්ත ආරම්භ කොට පවත්වාගෙන යන තැනැත්තන්ට ආධාර දීම හෝ සහය දීම සහ තාක්ෂණ සහ ශිල්පීය ක්‍රම ජනතාවට සාර්ථක ලෙස ලබාදීම සඳහා පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(එ) සංස්ථාවේ පරමාර්ථ ඉටු කරගැනීම සඳහා දේශීය සහ විදේශීය ශාඛා පිහිටුවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) පස්දෙනකුට නොඅඩු, නවදෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය. ආචාර්ය මර්වින් ධනවර්ධන ගුරුගේ මැතිතුමා සංස්ථාවේ ආරම්භක විධායක සභාපතිවරයා මෙන්ම යාවජීව විධායක සභාපතිවරයා ද වන්නේ ය. ශාමින්ද ධනවර්ධන ගුරුගේ සහ ඉන්දික ධනවර්ධන ගුරුගේ යාවජීව උප සභාපතිවරුන් වන්නේ ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුරයන් දැරුවා වූ ද, මේ පනතේ උපලේඛනයෙහි නම සඳහන් කර ඇති සාමාජිකයන්ගෙන් සමන්විත වූ ද, පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය. එම අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සභාපති, උප සභාපති දෙදෙනා හැර අන් අයගේ ධුර කාලය වසර 03 ක් විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාව සඳහා උපදේශක කමිටු පිහිටුවීම, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල සඳහා මුදල් ලබාගැනීම සඳහා විවිධ සංදර්ශන, ලොතරැයි ආදිය පැවැත්වීම, සංස්ථාවේ මුදල් ආයෝජනවල යෙදවීම, අවශ්‍ය සේවකයන් සහ නිලධරයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ඇතුළුව සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කරගැනීම හෝ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද නිලධරයන්, අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම් වලදී කටයුතු සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ නිලධරයන්ගේ කාර්යය හා කර්තව්‍ය සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල, සංස්ථාවේ මහසභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනමින් ගෙවිය යුතු සහ පදනමට ලැබිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ෆවුන්ඩේෂන් හි පැවති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ෆවුන්ඩේෂමට අයවිය යුතු සියලු ණය සහ පදනමට ගෙවිය යුතු සියළු සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙහිලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තිබිය යුතු අතර, සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිටදී සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මිස මණ්ඩලයේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද, ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළයුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය [4 (2) වගන්තිය]

**ප්‍රධාන ආධ්‍යාත්මික අනුශාසකවරු**

* අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත මාහිමි
* අති උත්තම දේව ධර්මාචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් කොළඹ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ (සිය කැමැත්ත පළ කිරීමට යටත්ව)
* හින්දු ආගමික පූජ්‍ය පක්ෂය වෙනුවෙන්
* ඉස්ලාම් ආගමික පූජ්‍ය පක්ෂය වෙනුවෙන්
* අතිපූජ්‍ය වල්පොල කල්‍යාණතිස්ස නායක නාහිමි ජාත්‍යන්තර ආගමික සංවිධායක, සූරිච්, ස්විට්සර්ලන්තය

1. ආචාර්ය මර්වින් ධනවර්ධන ගුරුගේ මහතා - ප්‍රධාන විධායක සභාපති
2. ශාමින් ද ධනවර්ධන ගුරුගේ මහතා උප සභාපති - අධ්‍යක්ෂ
3. ඉන්දික ධනවර්ධන ගුරුගේ මහතා උප සභාපති - අධ්‍යක්ෂ
4. ඇනිකන් කැතිරිනා හෙන්රික්සන් මෙනෙවිය ජාත්‍යන්තර සංවිධායක - නෝර්වේ - අධ්‍යක්ෂ
5. නිමල් එඩ්වඩ් දිසානායක මහතා (විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු) - අධ්‍යක්ෂ
6. ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා (විශ්‍රාමික මහාධිකරණ විනිසුරු) - අධ්‍යක්ෂ
7. රෝයිසිරි අබේගුණවර්ධන මහතා (විශ්‍රාමික සංස්ථා සාමාන්‍යාධිකාරී) - අධ්‍යක්ෂ
8. රාජපක්ෂ ගෙදර නාමල් ජයතිස්ස රාජපක්ෂ මහතා (සමාගම් සාමාන්‍යාධිකාරී) - අධ්‍යක්ෂ
9. සාමවිනිසුරු ක්වින්ටස් රොඩ්රිගෝ මහතා (මාධ්‍ය උපදේශක සහ සමාගම් අධ්‍යක්ෂ) - අධ්‍යක්ෂ

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.